(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 161.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2012 ජනවාරි මස 18 වැනි බදාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0653/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය වර්ෂ 8 තුළ එක් එක් වර්ෂයේදී, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම කොමිෂන් සභාව වෙත කරන ලද පැමිණිලි සංඛ්‍යාව සහ කොමිෂන් සභාව විසින් විමර්ශනය කරන ලද සිද්ධි සංඛ්‍යාව කොපමණද;

(iii) විනිශ්චය ලබා දෙන ලද සිද්ධි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විනිශ්චයන් ලබා දෙන ලද සිද්ධි සංඛ්‍යාවට වඩා වැඩි සිද්ධි සංඛ්‍යාවක් විමර්ශනය කිරීම සඳහා තිබෙන බව; සහ

(ii) කොමිෂන් සභාවට ස්වකීය කාර්යක්ෂමතාවය සහ ස්වාධීනත්වය නැති වූ බව;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඉහත කී (ආ) (ii) ප්‍රශ්නය වලංගු නොවේ නම්, කොමිෂන් සභාවේ දැනට පවතින තත්ත්වයට හේතුව සහ ඒ සඳහා ප්‍රතිකර්මය කවරේද;

(ii) සංවර්ධනය සඳහා වන උත්සාහයට අල්ලස හා දූෂණය ශාපයක් හා බාධකයක් වන්නේද;

(iii) එසේ නම්, දූෂණය මුලිනුපුටා දැමීම උදෙසා මුළුමනින්ම ස්වාධීන හා නිර්පාක්ෂික වූ කොමිෂන් සභාවක් පිහිටුවීම සිදු නොකරන්නේ මන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1397/'11

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, හක්මණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇල්ලෙවෙල, බටහිර ඉහලවත්තයාය අමුණේ ලැලි නොමැති බවත්;

(ii) එම හේතුවෙන් අවශ්‍ය පරිදි ජලය ලබා ගැනීමට නොහැකිව ප්‍රදේශයේ කුඹුරු ඉඩම් විශාල ප්‍රමාණයක් පාළුවට ගොස් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අවශ්‍ය ලෑලි සපයා එම අමුණේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා මේ වන විට ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) එසේ නම්, ඒ මුදල කොපමණද;

(iv) ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1663/'11

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය වෙත, 2011 වර්ෂයේදී වාහන ආනයනය කිරීමට පෙර පැවති වාහනවල,

(i) සංඛ්‍යාව, තත්ත්වය හා වටිනාකම්;

(ii) වර්ගයන් සහ මෙරටට ගෙන්වන ලද වර්ෂයන්;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම අමාත්‍යාංශය සඳහා 2011 වර්ෂයේදී ගෙන්වන ලද වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහන කවුරුන් විසින් ගෙන්වනු ලැබුවේද;

(iii) ගෙන්වන ලද එක් එක් වාහනයේ වර්ගය සහ වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම වාහන ගෙන්වීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1801/'11

4.

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ, කුඹියන්ගොඩ පාරේ පිහිටි වී. ටී. නානායක්කාර උද්‍යානය මාතලේ මහ නගර සභාව සතු බවත්;

(ii) මේ වන විට මෙම උද්‍යානයේ තිබූ වටිනා ගස් විශාල ප්‍රමාණයක් කපා ඉවත් කර ඇති බවත්;

(iii) එම ගස් කැපීමට යොදා ගත් යන්ත්‍ර උපකරණ හේතුවෙන් උද්‍යානයේ අනිකුත් දේපලවලට හානි සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත උද්‍යානය සතු මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඊට අයත් දේපල පිළිබඳ විස්තර කවරේද;

(iii) එහි ගස් කැපීම සඳහා මාතලේ මහ නගර සභාවේ අනුමතිය ලබා දී තිබේද;

(iv) ගස් කැපීමට යොදාගත් යන්ත්‍ර උපකරණ හේතුවෙන් උද්‍යානයේ දේපලවලට සිදුවූ අලාභ පියවා ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1805/'11

5.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් හෙලිකොප්ටර් යානා භාවිතා කිරීමේ වරප්‍රසාදය හිමි ප්‍රභූවරු කවුරුන්ද;

(ii) එම ප්‍රභූවරුන්ට ගුවන් හමුදා හෙලිකොප්ටර් යානා භාවිතා කළ හැකි අවස්ථා කවරේද;

(iii) පසුගිය වර්ෂ තුනක කාලය තුළ එක් එක් වර්ෂයේදී ගුවන් හමුදා හෙලිකොප්ටර් යානා භාවිතා කළ ප්‍රභූවරු වෙන් වෙන් වශයෙන් කවුරුන්ද;

(iv) එම එක් එක් ප්‍රභූවරයා හෙලිකොප්ටර් යානා මඟින් ගමන් කළ ගුවන් වාර සංඛ්‍යාව වාර්ෂිකව කොපමණද;

(v) එම ගුවන් ගමන් සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවට වැය වූ මුළු මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1908/'11

6.

ගරු එම්. ටී. හසන් අලි මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්ථිර නිෂ්පාදකවරයකුගේ තනතුරට පත්කරනු ලැබීම සඳහා පුද්ගලයකු සතුව තිබිය යුතු මූලික සුදුසුකම් කවරේද;

(ii) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ දෙමළ සේවයේ දැනට සේවය කරන ස්ථිර නිෂ්පාදකවරුන්ගේ සංඛ්‍යාව කොපමණද; සහ

(iii) ඉහත සඳහන් එක් එක් ස්ථිර නිෂ්පාදකවරයාගේ සුදුසුකම් විස්තර සහිතව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1923/'11

7.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොල් වගාකිරීමේ මණ්ඩලය යටතේ ඇති පොල් තවාන් පිහිටි ස්ථාන කවරේද;

(ii) එම තවාන් සඳහා බීජ පොල් තෝරා ගත් මව් ශාකවලින් ලබා ගන්නේද;

(iii) එසේ නම්, මව් ශාක සංඛ්‍යාව හා එම මව් ශාක පිහිටි වතු සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් පොල් තවාන්වලින්,

(i) 2010 වර්ෂය තුළ නිකුත් කළ මුළු පොල් පැළ සංඛ්‍යාව;

(ii) 2009 සහ 2010 වර්ෂයන්හි වෙන් වෙන් වශයෙන් යළ සහ මහ කන්නවලදී නිකුත් කළ පොල් පැළ සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පොල් පර්යේෂණ මණ්ඩලය යටතේ ඇති ඉඩම් ප්‍රමාණය අක්කර කොපමණද;

(ii) පොල් පර්යේෂණ මණ්ඩලය මගින් 2010 වර්ෂයේදී නිකුත් කළ පොල් පැළ සංඛ්‍යාව කොපමණද;

(iii) බීජ පොල් තවාන් කරනු ලබන ක්‍රියාපටිපාටිය කවරේද;

(iv) පොල් පර්යේෂණ මණ්ඩලය බීජ පොල් ලබාගන්නා ආයතනයන් කවරේද;

(v) එම ආයතනයන්ගෙන් 2009/2010 වර්ෂ තුළදී නිකුත් කළ බීජ පොල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම බීජ පොල් සාර්ථක මව්ශාඛවලින් ලබා ගෙන නොමැති බව පිළිගන්නේද;

(vii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2030/'11

8.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අන්තර්ජාලය හරහා සියලුම අමාත්‍යාංශ හා රජයේ දෙපාර්තමේන්තුවල විවිධ තොරතුරු මහජනයාට බලා ගැනීමට සලසා ඇති පහසුකම යටතේ මැතිවරණ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය තුළින් මැතිවරණ ප්‍රතිඵල ඇතුළු විවිධ තොරතුරු දැනටමත් මහජනයාට දැනගැනීමට කටයුතු කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට ලංකාවේ පුරවැසියන්ගේ ඡන්ද හිමි නාමලේඛනය මැතිවරණ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට ඇතුළත් කර තිබේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) ඡන්ද හිමි නාමලේඛනය ඇතුළත් වෙබ් අඩවියක් තිබේ නම්, ඒ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඡන්ද හිමි නාමලේඛනය අන්තර්ජාලයට ඇතුළත් කිරීම තුළින් ඡන්දදායකයන්ට හා එක් එක් පක්ෂවල නියෝජිතයන්ට එහි තොරතුරු පහසුවෙන් ලබා ගැනීමට ද, සංශෝධනය විය යුතු තොරතුරක් වේ නම් අදාළ බලධාරීන්ට එය නොපමාව දැනුම්දීමට ද හැකියාව ලැබෙන හෙයින් ඡන්දහිමි නාමලේඛනය ද මැතිවරණ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට ඇතුළත් කරවීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0655/'10

9\.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය වර්ෂ 3ක කාලය තුළ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් වූ සිසුන් සංඛ්‍යාව වාර්ෂික පදනමින් කොපමණද;

(ii) පසුගිය වර්ෂ 20ක කාලය තුළ උපාධි අපේක්ෂකයන් සඳහා ලබා දුන් මහපොළ ශිෂ්‍යත්ව සංඛ්‍යාව වාර්ෂික පදනමින් කොපමණද;

(iii) ඉහත සඳහන් සංඛ්‍යාව සහ ඉහත සඳහන් කාල සීමාව තුළ එක් එක් වර්ෂයේදී විශ්වවිද්‍යාලවලට ඇතුළත් වූ සම්පූර්ණ ශිෂ්‍ය සංඛ්‍යාව අතර සන්සන්දනය කවරේද;

(iv) පසුගිය වර්ෂ 6 තුළ ශිෂ්‍යත්වලාභීන්ට දීමනා වශයෙන් ගෙවූ මුදල වාර්ෂික පදනමින් කොපමණද;

(v) පසුගිය වර්ෂ 10 තුළ මහපොළ ශිෂ්‍යත්ව අරමුදලට ලැබුණු ආදායම් වාර්ෂික පදනමින් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1398/'11

10\.

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මාතර - බෙලිඅත්ත මාර්ගයේ, කුඩාහිල්ල පාලම ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් දැඩි ලෙස අබලන් වී ඇති බවත්;

(ii) අවස්ථා කිහිපයකදී මෙම පාලම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මිනුම් කටයුතු සිදු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලමේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් ආරම්භ කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මේ වන විට වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1664/'11

11\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ අග භාගයේදී සහ 2011 වර්ෂයේ මුල් කාල සීමාවේදී ලංකා සතොස ආයතනය විසින් ඉන්දියාවෙන් ආනයනය කරන ලද කුකුල් මස් ප්‍රමාණය කොපමණද;

(ii) ආනයනය කරන ලද එක් මස් කිලෝවක් සඳහා ඉන්දියාවට ගෙවන ලද මුදල කොපමණද;

(iii) එම කුකුල් මස් ගබඩා කළ ස්ථාන කවරේද;

(iv) ගබඩා කළ ස්ථානයන්ගෙන් පරිභෝජනය සඳහා කුකුල් මස් නිදහස් කළ දිනය, ප්‍රමාණය සහ ලබාගත් ආයතන එක් එක් ගබඩාවලට අදාළව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) 2011 වර්ෂයේ ජූනි මස වන විට ඉහත කුකුල් මස් තොගවලින් ගබඩාවල ඉතිරිව් තිබූ ප්‍රමාණය කොපමණද;

(vi) එම ඉතිරි තොග සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1802/'11

12.

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතලේ, හිග්ගොල්ල ප්‍රධාන සුසාන භූමියට පිවිසෙන මාර්ගයේ, දේවාලය අසල ඇති ඉඩම මාතලේ මහ නගර සභාව සතු බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ඉඩම නගර සභාවේ ප්‍රයෝජනයට හෝ වෙනයම් කටයුත්තක් සඳහා යෙදාගෙන තිබේද;

(ii) එම ඉඩම නාගරික මන්ත්‍රීවරයෙකුගේ පරිහරණය සඳහා ලබා දී තිබේද;

(iii) එසේ නම්, එම ඉඩම ලබාදී ඇති පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මාතලේ මහ නගර සභාව සතු ඉඩම් පුද්ගලික පරිහරණය සඳහා ලබා දිය හැකිද;

(ii) මහ නගර සභාව සතු ඉඩම් එසේ ලබා දීමට පළාත් පාලන පනතේ විධිවිධාන සලසා තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා මහ නගර සභාව අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1806/'11

13.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ප්‍රතිපත්තිය යටතේ මතට තිත වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ කුමක්ද;

(ii) මතට තිත වැඩසටහන ක්‍රියාත්මක වූ දින සිට මේ දක්වා එක් එක් වර්ෂයේදී මත්පැන් අලෙවිය සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) පසුගිය වර්ෂ පහ තුළ එක් එක් වර්ෂයේ මත්පැන් අලෙවි කළ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ගත වූ වර්ෂ කිහිපය තුළ මතට තිත වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් ලද ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1924/'11

14.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) පින්නවල අලි අනාථාගාරය ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) ආරම්භ කළ අවස්ථාවේ සිටි අලි ඇතුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ආරම්භ කළ දිනයේ සිට මේ දක්වා අලි අනාථාගාරයේදී ඉපදුන අලි ඇතුන් සංඛ්‍යාව කොපමණද;

(iv) වනයට මුදා හල අලි ඇතුන් සංඛ්‍යාව කොපමණද;

(v) ආරම්භයේ සිට මේ දක්වා අලි අනාථාගාරය තුළ එක් එක් වර්ෂයේදී මිය ගිය අලි ඇතුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පින්නවල අලි අනාථාගාරයෙන් ලබා ගෙන ජනාධිපතිතුමා විසින් මාතර අලුත්නුවර දේවාලයට පූජා කළ ඇත් පැටවාගේ වයස කොපමණද;

(ii) එම ඇත් පැටවාගේ මව ජීවතුන් අතර සිටින්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2031/'11

15.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විවිධ ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයන්හි අනුබද්ධ ආයතන ලෙස හුවා දක්වමින් එම විශ්වවිද්‍යාල නාමයන් යටතේ ක්‍රියාත්මකවන පුද්ගලික අධ්‍යාපන ආයතන රැසක් දැනට ශ්‍රී ලංකාවේ පවතින බවත්;

(ii) රජයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමිවූ සිසුන් විශාල සංඛ්‍යාවක් එම අධ්‍යාපන ආයතනවලට ඇතුළත්වීමට උත්සාහ කරන බවත්;

(iii) ඔවුන් අතර වත්පොහොසත්කම් නොමැති සාමාන්‍ය පවුල්වල දරුවන් ද සිටින බවත්;

(iv) එම සමහරක් අධ්‍යාපන ආයතන හුදෙක් මුදල් උපයා ගැනීමේ අරමුණින් පමණක් පවත්වාගෙන යන බවත්;

(v) සමහර ආයතන මඟින් කිසිදු පිළිගැනීමක් නොමැති සහතික නිකුත් කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) දැනට ලංකාව තුළ විවිධ ජාත්‍යන්තර විශ්වවිද්‍යාල නාමයන් යටතේ ක්‍රියාත්මක පුද්ගලික අධ්‍යාපන ආයතන පිළිබඳ සංගණනයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එවැනි අධ්‍යාපන ආයතන පවත්වාගෙන යෑම සඳහා, අවශ්‍ය ගුණාත්මකභාවය හා තත්ත්ව පරීක්ෂාකර විධිමත් ලියාපදිංචියක් ලබාගැනීම අනිවාර්ය කෙරෙන වැඩ පිළිවෙළක් සැකසීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 6 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

බදු අභියාචන කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනි වර කියවීම.

*4.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 1),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වැනි වගන්තිය යටතේ භාණ්ඩ අපනයනය කිරීම මත සෙස් බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් පනවනු ලදුව, 2011 නොවැම්බර් 21 දිනැති අංක 1733/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.21 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 2),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වැනි වගන්තිය යටතේ භාණ්ඩ ආනයනය කිරීම මත සෙස් බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් පනවනු ලදුව, 2011 නොවැම්බර් 21 දිනැති අංක 1733/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.21 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන සහ අපනයන (පාලන) පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සහ 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ආනයන බලපත්‍ර සහ ගෙවීම් ක්‍රම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2012 ජනවාරි 02 දිනැති අංක 1739/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ, 2012.01.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අධිකරණ අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ නියමය,—2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 සැප්තැම්බර් 26 දිනැති අංක 1725/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ, 2011.11.28 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*8.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*9.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*10.

රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

කෘෂිකර්ම අමාත්‍යතුමා,— පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නියෝග,— 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 26 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 ජුලි 27 දිනැති අංක 1716/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.12 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*14.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*16.

විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*17.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."
යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*20.

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වන) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

21.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

22.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

23.

කොටසර පියංගල රජමහා විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

24.

එස්. බී. නාවින්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0944/'10

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මාතර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, වැලිගම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනයවන රජයේ පාසල් අතරින්,

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0945/'10

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, පස්ගොඩ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනයවන රජයේ පාසල් අතරින්,

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0946/’10

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, කොටපොල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනයවන රජයේ පාසල් අතරින්,

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0947/’10

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මාතර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, දික්වැල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනයවන රජයේ පාසල් අතරින්,

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0948/'10

5.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මාතර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, දෙවිනුවර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් අතරින්,

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0949/'10

6.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, තිහගොඩ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් අතරින්,

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0950/'10

7.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, මාලිම්බඩ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් අතරින්,

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0951/'10

8.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, හක්මන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් අතරින්,

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0952/'10

9.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, කඹුරුපිටිය කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් අතරින්;

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0953/'10

10.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, අකුරැස්ස කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් අතරින්,

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0954/'10

11.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, වැලිපිටිය කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් අතරින්,

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0955/'10

12.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, මොරවක කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් අතරින්,

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?